# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2360/52 - 2023 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2023.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | | | | *II වැනි තීරුය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය* | *විස්තරය* | |
| 1 | 04.03 | 0403.20 | යෝගට් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| | | 0403.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| 2 | 04.05 | 0405.10 | වෙඬරු | කි. ග්‍රෑමයට රු. 1,500 |
| | | 0405.20 | කිරිවලින් නිපදවූ තැවරුම් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| | | 0405.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 2,000 |
| 3 | 04.06 | 0406.20 | සියලුම වර්ගවල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි. ග්‍රෑමයට රු. 600 |

උපලේඛනය *(සම්බන්ධිතයි)*

| | | | | |
|---|---|---|---|---|
| 4 | 07.03 | 0703.10.20 | බොම්බයි ළූනු | කි. ග්‍රෑමයට රු. 10 |
| 5 | 08.04 | 0804.10.10 | රටඉඳි - අලුත් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 0804.10.20 | රටඉඳි - වියළි | කි. ග්‍රෑමයට රු. 200 |
| 6 | 08.05 | 0805.10.10 | දොඩම් - අලුත් | කි. ග්‍රෑමයට රු. 600 |
| 7 | 08.06 | 0806.10 | මිදි - අලුත් | කි. ග්‍රෑමයට රු. 600 |
| 8 | | 0806.20 | මිදි - වියළි | කි. ග්‍රෑමයට රු. 600 |
| 9 | 08.08 | 0808.10 | ඇපල් | කි. ග්‍රෑමයට රු. 600 |
| 10 | 08.10 | 0810.90.90 | අනෙකුත් - පළතුරු | කි. ග්‍රෑමයට රු. 600 |
| 11 | 16.04 | 1604.11 | සැමන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.12 | හුරුල්ලන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් ඇටවල්ලා සහ බොනිටෝ (සර්ඩා විශේෂයන්) | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.15 | මැකරල් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.16 | ඇන්චෝවිසි | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.17 | ආදන් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 200 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාළු | කි. ග්‍රෑමයට රු. 200 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද සහ 2023 ජනවාරි 04 දිනැති අංක 2313/34 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය, 2023 දෙසැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

3. මෙම නියමය 2023 දෙසැම්බර් මස 01 දිනෙන් ආරම්භ වී 2024 දෙසැම්බර් 31 වැනි දින දක්වා 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව වලංගුව පැවතිය යුතු ය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 12 - 0015

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.